# 2019 ට අයවැය දෙකක්?

නිදහසින් පසු ප්‍රථම වරට එකම රජයක් යටතේ අයවැයක් සහ සංශෝධිත අයවැයක් ලෙස අයවැය දෙකක් එකම වර්ෂයක ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වත්මන් රජය අලුත් වාර්තාවක් තැබීමට යයි. රජය 2019 අයවැය කථාව ඉදිරිපත් කළේ 2019 මාර්තු 05 දාය. 2018 ඔක්තෝබර් 26 දී සිදුවූ පෙරළිය නිසා ඇතිවූ දේශපාලන අර්බුදයට 2019 අයවැය දෙවන වර කියවීමේ අවස්ථාව අහිමිවුණි. 2018 දෙසැම්බර් 17 දින වත්මන් ආණ්ඩුව නැවත බලයට පත් වුවද 2019 සඳහා අයවැයක් ඉදිරිපත් කිරීමට කාලය මදිවිය. එනිසා අතුරු සම්මත ගිණුමක් (Vote on Account) ඉදිරිපත් කළ අතර 2019 නියම අයවැය කථාව ඉදිරිපත් කිරීමට සිදුවූයේ 2019 මාර්තු 05 දාය.

අයවැය ඉදිරිපත් කොට මාස 1 1/2 ක් ගතවූ පසු එනම් 2019 අප්‍රේල් 21 වැනි පාස්කු ඉරිදා ගෝලීය ආගමික ත්‍රස්තවාදය නිසා දරුණු විනාශයක් රටට සිදුවිය. එම විනාශය සිදුවී මසක් ගතවූ පසු එහි බලපෑම රජය ඉදිරිපත් කළ 2019 අයවැයටද බලපෑමක් වී ඇත. ගණන් බලා තිබෙන ආකාරයට 2019 අයවැයෙන් අපේක්ෂිත ආදායම් හා ප්‍රදාන වශයෙන් වූ රුපියල් බිලියන 2464 න් රුපියල් බිලියන 50 ක් පමණ අඩුවීමේ අවදානමක් ඇති බව වාර්තා වේ. එම අඩුවීම විශේෂයෙන් වාර්තා වනුයේ සංචාරක ව්‍යාපාර සහ සිල්ලර වෙළෙඳාම් අංශයෙන්වලිනි. මේ නිසා 2019 අයවැයේ ඉලක්ක (එනම් බලාපොරොත්තු) ඉටුකර ගැනීමේ හැකියාවට රජය මුහුණදී සිටී.

**2019 අයවැය ඉලක්ක**

| අයිතමය | බිලියන | ද.දේ.නි. |
|---|---|---|
| බදු ආදායම | 2077 | 13.3% |
| බදු නොවන ආදායම | 267 | 1.7% |
| පළාත් සභා බදු ආදායම | 107 | 0.7% |
| ප්‍රදාන | 13 | 0.1% |
| මුළු ආදායම් සහ ප්‍රදාන | 2464 | 15.8% |
| මුළු වියදම | 3149 | 20.2% |
| සම්පූර්ණ අයවැය හිඟය | (685) | 4.4% |

අන්ත වශයෙන් ආගමික ත්‍රස්තවාදය ඇති නොවන්නට රජය මූල්‍ය අංශයේ ස්ථාවරභාවය එකින් පවත්වමින් කිරීමේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ක්‍රියාවලිය වත්මන් රජය විසින් පවත්වමින් කර ගනිමින් සිටියේය. එනම් 2017 වර්ෂයේ වාර්තා වූ සියයට 5.5 ක අයවැය හිඟය 2018 දී සියයට 5.3 කටත් 2019 දී සියයට 4.4 කටත් 2020 දී සියයට 3.5 කටත් වශයෙන් ක්‍රමයෙන් අඩුකර ගැනීම එහින් එකකි. එසේම පොලී වියදම් හැර ගණන් බලන අයවැයේ ප්‍රාථමික ශේෂය (PRIMARY BALANCE) 2017 දී එය සියයට 0.2 ක්, 2018 දී සියයට +0.6 ක් හා 2019 දී සියයට +1.5 ක් හා 2020 දී සියයට +2.4 ක් ලෙස වර්ධනයක් වාර්තා කරමින් රජයේ අයවැය ශේෂයේ කටයුතුවල ප්‍රගතියක් වාර්තා කිරීම අපේක්ෂා විය. එසේම රජය ආදායමට වඩා රජයේ වියදම (වර්තන වියදම්) ඉහළ යාම නිසා රජයේ ඉතුරුම් 2017 දී සියයට 0.7 ක් 2018 දී සියයට 1.2 ක් වශයෙන් සෘණ තත්ත්වයක් වාර්තා කළද 2019 දී එය සියයට 0.2 ක් හා 2020 දී සියයට 1.1 ක් ලෙස ධන තත්ත්වයක් වාර්තා කිරීමටද සැළසුම් සකස්වී තිබියේය.

එම ඉලක්ක වෙත ළඟාවීමට කරමින බාධාවන් වූයේ රජයේ බදු ආදායම් 2016 සිට 2018 දක්වා ක්‍රමයෙන් සියයට 14.1 ක් සියයට 13.6 ක් සහ සියයට 13.3 ක් ලෙස අඩුවී යාමය. එම බදු ආදායම් ඉහළ නැංවීමට හා ශක්තිමත් අංශ වැඩිදියුණු කිරීමටද රජය ප්‍රතිසංස්කරණ කිහිපයක් ක්‍රියාත්මක කරමින් සිටුණි. එනම් 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනත බලාත්මක කිරීම එකතු අගය මත බදු (VAT) පනත සංශෝධනය කිරීම, සංචාරකයන් සඳහා VAT බදු ආපසු ගෙවීමේ පද්ධතියක් (VRS) ස්ථාපිත කිරීම ඇතුළත් සංචාරක අංශය ප්‍රවර්ධනය කිරීම රජයේ ආනයනය මත සිරස් බදු පැනවීමෙන් අධික ලෙස අපනයන අපේක්ෂාවන් කිරීම, ඉන්ධන සඳහා මිල සූත්‍රයක් හඳුන්වාදීම, බදු පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා




ජාත්‍යන්තර ආයතනවල සහයද ලබාගෙන සංශෝධිත අයවැයක් 2019 ජූලි මස මුල වන විට ඉදිරිපත් කිරීමට කටයුතු යොදමින් සිටින බව පෙනේ. එසේ වුවහොත් 2015 බලයට එනවිට ඊට කලින් සිටි රජයේ අයවැය ඉවත් කොට අතුරු අයවැයක් ඉදිරිපත් කොට වාර්තාවක් තැබූ මේ රජය, ආගමික ත්‍රස්තවාදය හමුවේ 2019 සඳහා අයවැය දෙකක් සම්මත කොට තවත් වාර්තාවක් තබනු ඇත.

ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (RAIMS) වැඩිදියුණු කිරීම ජාතික තනි ප්‍රවේශ පද්ධතියක් (NSW) ස්ථාපිත කිරීමට පියවර ගැනීමෙන් ආනයනකරුවන් සහ අපනයනකරුවන්ට පහසුකම් සැලසීමට කටයුතු කිරීම මෝටර් වාහන මත නිෂ්පාදන බද්ද වැනි කොට මෝටර් වාහන ආනයන පහසු කිරීම වැනි ප්‍රතිසංස්කරණ යන්ත්‍රණාවන් ක්‍රියාත්මක කර තිබුණි.



**ප්‍රවීණ ආර්ථික විශ්ලේෂක**
**වින්සන් මර්වින් ප්‍රනාන්දු**

රජය වියදම්වලදුද අඩු වීමක් සිදු කළේය. එනම් රජයේ පොදු වියදම් දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 2015 වර්ෂයේ සියයට 5.4 සිට 2018 වන විට සියයට 4.2 දක්වා අඩු කිරීමත් වර්තන වියදම් 2015 දී සියයට 15.5 සිට 2018 වන විට සියයට 14.5 දක්වා අඩුකර ගැනීමත් මුළු වියදම් හා ශුද්ධ ණයදීම් 2015 දී සියයට 20.9 සිට 2018 වන විට සියයට 18.6 කට අඩුකර ගැනීමත් සිදු කළේය. රාජ්‍ය වියදම් නිසි ලෙස කළමනාකරණය කිරීමටද රජය පියවර රැසක් ගෙන තිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය ස්වයං ක්‍රියාකරණය කොට එහි කාර්යක්ෂමතාව වැඩිකිරීම, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) ජාතික උපාය මාර්ගයක් ලෙස ප්‍රවර්ධනය කිරීම ආයතනික අභිප්‍රාය ප්‍රකාශ (SCIs) අත්සන් කොට රජය සතු ව්‍යාපාර වස්තූන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම ඉන්ධන සඳහා ස්වයංක්‍රීය මිල යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම ඉන් ප්‍රධාන තැනක් ගනී.

රාජ්‍ය ආදායම් වැඩි කොට රාජ්‍ය වියදම් අඩුකොට අයවැය හිඟය අඩු කරමින් රාජ්‍ය ණය අඩුකිරීමට රජය කල්පනා කළත් 2014 රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 71.3 ක ප්‍රතිශතය කර පැවති 2018 දී සියයට 82.9 ක් කිරීම පත් කරමින්. එය 2019 දී සියයට 90 ඉක්මවනු ඇතැයි පවසේ. 2018 වසරේ අගවන විට රුපියල අධික ලෙස අවප්‍රමාණය වීම නිසා රාජ්‍ය ණය රුපියල් බිලියන 11977 දක්වා ඉහළ ගියේය.

පසු මෙසේ තිබියදී 2019 අප්‍රේල් 21 දා එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය නිසා ජීවිත රැසක් අහිමි වීම, විශාල පිරිසක් තුවාල වීම, සංචාරක කර්මාන්තය කඩාවැටීම, ව්‍යාපාර අඩපණ වීම නිසා එයින් අපේක්ෂිත රජයේ ආදායම් අඩුවීමට පටන්ගෙන තිබේ. අනෙක් අතට විනාශ වූ ගොඩනැගිලි සහ දීමට රජයට විශාල වියදමක් දැරීමට සිදුවී තිබේ. ඒ අතරම IMF සියයට ආකාරයට අයවැය හිඟය 2020 දී සියයට 3.5 කට අඩු කර ගැනීමටද අවශ්‍ය වේ. මේ තත්ත්වය ඉටු කිරීමටත් ආර්ථික වර්ධන වේගය අඩුවීමේ වේගය පාලනය කිරීමටත් ආරක්ෂක වියදම් වැඩි කොට ක්‍රමයෙන් පැතිරී යන ත්‍රස්තවාදී බිය මුලිනුපුටා දැමීමටත් රජයේ අයවැය සංශෝධනය කිරීම අවශ්‍ය නිසා ජාත්‍යන්තර ආයතනවල සහයද ලබාගෙන සංශෝධිත අයවැයක් 2019 ජූලි මස මුල වන විට ඉදිරිපත් කිරීමට කටයුතු යොදමින් සිටින බව පෙනේ. එසේ වුවහොත් 2015 බලයට එනවිට ඊට කලින් සිටි රජයේ අයවැය ඉවත් කොට අතුරු අයවැයක් ඉදිරිපත් කොට වාර්තාවක් තැබූ මේ රජය, ආගමික ත්‍රස්තවාදය හමුවේ 2019 සඳහා අයවැය දෙකක් සම්මත කොට තවත් වාර්තාවක් තබනු ඇත.